ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1494— 2007 අප්‍රේල් 20 වැනි සිකුරාදා — 2007.04.20

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන පරිගනක මුද්‍රණ රටා (සිත්තම්) නිර්මාණය පිළිබඳ පාඨමාලාව
Certificate Course in Computer Graphic Designing

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාල පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින රජයේ මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාල දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984දී පාර්ලිමේන්තු ආඥා පනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාල පහත සඳහන් ග්‍රැෆික් පාඨමාලාව 2007 මැයි අග භාගයේදී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාවන් මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහල රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකසා ඇත.

පරිඝනක ආශ්‍රිත රූ රටා නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
Certificate Course in Computer Graphic Designing

මෙම පාඨමාලාව ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත්වීමට බලාපොරොත්තු වන නවකයින්ට මෙන්ම එම ක්ෂේත්‍රයන්හි නියැලී සිටින සේවක මහතුන් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිඝණක ආධාරයෙන් ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාල මෘදුකාංග පිළිබඳ පුළුල් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ද ලබාදෙයි.

පාඨමාලා කාලය	-	පැය 114යි (මාස 4)
මාධ්‍යය	-	සිංහල/ඉංග්‍රීසි
ගාස්තුව	-	රු. 10,500
වේලාවන්	-	සතිපතා සහ සති අන්ත පන්ති කීපයක් පැවැත්වේ.

Course Outline

* **Introduction to Computers**
  (Hard Ware and Soft Ware for Graphics Industry)
* Introduction to **Adobe-Indesign** for Page Make-up
* Creating and Designing Vector Graphics using **Macro Media Free Hand**
* Creating and Designing Vector Graphics using **Corel Draw**
* Creating and Designing Vector Graphics using **Adobe Illustrator**
* **Light and Colour** :
  Colour Theory and Colour management, Pantone Traditional CMYK and Hexachrome Colour management Systems.
* How to use **Adobe Photoshop** as a Raster Graphic Image manipulation application
  Photoshop and Tools
  Image Correction and Image Manipulation
  Colour Corrections and Adjustment
  2D-3D in Photoshop
  Image Modes and Blending Modes
  Photoshop inbuilt and Third party plug-in Filters
  Using Layers, Channels and Basic Palettes
  Working with paths and vector shapes
  Masking Systems in Photoshop
* **Scanning Technology** : How to use Scanner for printing Technology (From Black and White to Colour)
* **Out Put Techniques** : Colour Separations and Special Colour out putting
* Visit to Industry Bureaus and Printing Houses to understand the operations of Image Setters and Printing Processors.

මෙම පාඨමාලාවන්ට ඇතුලත්වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගනු ලබන අපේක්ෂකයන්ට පමණක් පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබේ. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

විමසීම්-ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
ටෙලිෆෝන් : 2686162/2679791
ෆැක්ස් : 2686162, ඊමේල් : sliopreg@sltnet.lk

04-394

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

ශ්‍රී ලංකා දුම්රිය සේවය
ඉලාස්ටික් රේල් ක්ලිප්ස් 300,000ක් (බිටුමන් ආලේපිත) සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ස්ථිර දුම්රිය මාර්ගවල නැවත රේල් පිලි/සිල්පර යෙදීමේ කාර්යය සඳහා අවශ්‍ය බිටුමන් ආලේපිත රේල් ක්ලිප්ස් (Bituminous Coated Elastic Rail Clips) 300,000ක් සැපයීම සඳහා නිෂ්පාදකයන්ගෙන් /සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ඔවුන්ගේ ටෙන්ඩර්පත්‍ර කෙලින් ම හෝ ඇටෝර්නි බලය පවරනු ලැබූ නියෝජිතයින් මගින් ඉදිරිපත් කළ හැක.

02. ආපසු නොගෙවනු ලබන රු. 3,000 ක මුදලක් හෝ පහසුවෙන් මාරුකළ හැකි ඒ හා සමාන විදේශ විනිමය ප්‍රමාණයක් ගෙවා කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් 2007.06.01 දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

03. ඉලාස්ටික් රේල් ක්ලිප්ස් නිෂ්පාදනය ISO 9001 : 2000/ISO 9002 : 1994/BSEN ISO 9001 : 2000/BSEN ISO 9002 : 1994 සහතික ලත් ආයතනයක් විසින් හෝ මිළදී ගන්නාට පිලිගත හැකි ඒ හා සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමණාකරණ ක්‍රමයක් සහිත ආයතන විසින් කළ යුතුය.

04. 2007.06.05 දින ප. ව. 2.00 දක්වා ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

05. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ වහාම ඉහත අංක 4 යටතේ වූ ලිපිනයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය.

06. කොළඹ 10, ඕල්කට් මාවතේ, පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් ආකෘතිපත්‍ර නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමුව- එස්ආර්එස්/6564
04-400

ශ්‍රී ලංකා දුම්රිය සේවය

ඩිස්ටන්ස් බෝල්ට් (Distance Bolts) 45,000ක් මිළදී ගැනීම සඳහා ටෙන්ඩරය

කොළඹ 10, ඕල්කට් මාවතේ, පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් ඩිස්ටන්ස් බෝල්ට් (Distance Bolts with Nuts Ferrules and Washers) 45,000ක් මිළදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. නිෂ්පාදකයින්ට, ඇටෝර්නි බලය පවරනු ලැබූ තම නියෝජිතයින් මගින් ද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

02. ආපසු නොගෙවනු ලබන රු 2,500 ක මුදලක් හෝ පහසුවෙන් මාරුකළ හැකි ඒ හා සමාන විදේශ විනිමය ප්‍රමාණයක් ගෙවා, කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් 2007.06.08 දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

03. ටෙන්ඩර් පත් භාරගැනීම 2007.06.12 දින ප. ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කරනු ලැබේ.

04. මෙම විෂය නිෂ්පාදනය/සැපයුම භාරගනු ලබන ආයතන ISO 9001:2000/BS EN ISO 9001:2000 හෝ මිළදී ගනු ලබන්නා අනුමත කළ හැකි ඒ හා සමාන ජාත්‍යන්තරව පිළිගතහැකි තත්ව පාලන සහතික ලබා තිබිය යුතුයි.

05. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මූලස්ථාන කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කිරීම සිදු කරනු ලැබේ. එම අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි විය හැකිය.

06. මුද්‍ර තබන ලද ටෙන්ඩර් පත් ගෙනැවිත් භාරදීමට හෝ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

07. කොළඹ 10, ඕල්කට් මාවතේ, පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් ආකෘතිපත්‍ර නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමුව - එස්ආර්එස්/එෆ් 6564
04-401

බඩු බාහිරාදිය විකිණීම්

අධිකරණ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වැලිමඩ, මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන නඩුවලින් අයිතිකරුවන් නොමැති රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ 2007.05.05 වැනි දින පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අයිතිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

03. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

04. අපේක්ෂිත මිළ ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

05. භාණ්ඩ මිළදී ගත් වහාම අදාල මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් භාණ්ඩ ඉවත් කර ගත යුතුය. ගෙවීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

06. නඩු භාණ්ඩ මිළදී ගන්නන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

දිසා විනිසුරු හා මහේස්ත්‍රාත්,
වැලිමඩ.

2007 මාර්තු මස 26 වැනි දින,
වැලිමඩ, දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අප්‍රේල් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ලක්ෂමන් ගුණවර්ධන
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.

අනු අංකය	නඩු අංකය		භාණ්ඩ විස්තය	
01	61399	i.	ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස් වර්ගයේ ඉරු දැව කැබලි 06ක් පමණ	
		ii.	ඉරුම් බංකුවක්	
		iii.	කියත් තලයක්	
02	67351	i.	ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස් වර්ගයේ ලී කැබලි 11ක් පමණ	
		ii.	ඉරුම් බංකුවක්	
		iii.	කියත් තලයක්	
03.	68071	i	ඉයුකැලිප්ටස් වර්ගයේ ඉරු දැව කැබලි 07 පමණ	
		ii	ඉරුම් බංකුවක්	
		iii	කියත් තලයක්	
04	65059		ග්‍රාන්ඩිස් වර්ගයේ ඉරු දැව කැබලි 93යි	
05	ඒ.ආර්.636/06		ටූනැ ලැලි 170ක් පමණ	
06	66552		ඉයුකැලිප්ටස් වර්ගයේ ඉරු දැව කැබලි 25යි	
07	63400		සඳුන් කිලෝ 81යි	
08	68601		සඳුන් කිලෝ 50යි	
09	62283		සඳුන් කිලෝ 308යි	
10	53560		අධි ශීතකරණයක්	
11	66564		ගෑස් සිලින්ඩරයක් හා ගෑස් ලිපක්	
12	69044		i සවල් 01යි	
			ii බාල්දි 01යි	
13	66072		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
14	66177		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
15	66184		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
16	67238		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
17	67240		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
18	69184		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
19	69185		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
20	69186		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
21	69187		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
22	69189		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
23	69190		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
24	69612		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
25	69614		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
26	69615		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
27	69618		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
28	69188		අඩිය සිදුරු කරන ලද බාල්දි	01යි
29	අංක රහිත		තරාදි	
			තරාදි පඩි	
30	අංක රහිත		තඹ	
31	අංක රහිත		යකඩ	
32			හිස් කෑන්	
33			හිස් බැරල්	
34			විදුරු	
35	36076		i. පිගන්	06යි
			ii. කරිදිසි	07යි
			iii. පොඩිවිදුරු	11යි
			iv. අශෝක වීදුරු	06යි

04-333

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය – මොරටුව

නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2007.05.20 දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් භාණ්ඩ පිළිබඳ හිමිකම් කියන්නන් සිටී නම් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පිට එදින පෙ. ව. 9.00ත් 9.30ත් අතර කාලය තුළ භාණ්ඩ පරීක්ෂාවට ඉඩ දෙනු ලැබේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගැනෙන අවස්ථාවලදී අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා අත්පිට මුදල් ගෙවිය යුතු අතර චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දී ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. භාණ්ඩ මිලදී ගැනීමේ දී අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත අත්‍යාවශ්‍ය බව ද මෙයින් දන්වමි.

එම්. එන්. බුරාන්,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
මොරටුව.

2007 මාර්තු මස 22 වැනි දින,
මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වෙන්දේසි ලේඛනය

01 ඒ. ආර්. 01/05	පී. ආර්. 76	රත් යැයි කියන මාලය
02.	පී. ආර්. 77	රත් යැයි කියන මුදුව
03.	පී. ආර්. 89	රතු ගලක් ඇල්ලූ නයිපෙනය සහිත මුදුව
04.	පී. ආර්. 91	රත් යැයි කියන මුදුව
05.	පී. ආර්. 92	රත් යැයි කියන මාලය
06.	පී. ආර්. 95	රත් යැයි කියන ජිප්සි ජෝඩුව
07.	පී. ආර්. 96	රත් යැයි කියන මාලය
08.	පී. ආර්. 103	රත් යැයි කියන මාලය
09.	පී. ආර්. 105	රත් යැයි කියන මුදුව
10.	පී. ආර්. 106	රත් යැයි කියන කුරුස හැඩ පෙන්ඩන්ට් 01
11.	පී. ආර්. 109	රත් යැයි කියන රතු ගලක් සහිත කාන්තා මුදුව
12.	පී. ආර්. 110	රත් යැයි කියන සුදු ගල් දෙකක් සහිත කාන්තා මුදුව
13. ඒ. ආර්. 02/05	පී. ආර්. 81	රත් යයි කියන ගල් 03ක් සහිත පෙන්ඩන්ට් 01
14.	පී. ආර්. 86	රත් යැයි කියනු ලබන මුදුව
15. ඒ. ආර්. 02/05	පී. ආර්. 90	රත් යැයි කියනු ලබන මුදුව
16.	පී. ආර්. 147	රත් යැයි කියන බෝ කොලය සහිත අත් පළඳනාව රත් යැයි කියන මාලය
17.	පී. ආර්. 172	රත් යැයි කියනු ලබන තඹ හැඩයේ මාලය
18. ඒ. ආර්. 404	පී. ආර්. 148	රත් යැයි කියනු ලබන වළල්ල
19. ඒ. ආර්.430/05	පී. ආර්. 59	කේ. ඊ. ජංගම දුරකථ01 එරික්සන් ජංගම දුරකථනය 01 සෝනි එරික්සන් ජංගම දුරකථන 01
20. 42429	පී. ආර්. 19	එස්. ටී. 261 එස්. එල්. දරන ටෙලිසොනික් වර්ගයේ කැසට් රෙකෝඩරය
21. 27281	පී. ආර්. 88	අංක එස්. එච්. අයි. ඊ. පී. 07159 දරන ඩෙක් යන්ත්‍රය
22 45282	පී. ආර්. 181	බෝධිපූජා පොත්
23. ඒ.ආර්.442/06	පී. ආර්. 188	සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනය
24. ඒ. ආර්.441/06	පී. ආර්. 18	සෝනි වර්ගයේ කලු පැහැති ජංගම දුරකථනය
25. ඒ. ආර්. 321/06	පී. ආර්. 136	මෝටරෝලා වර්ගයේ සුදු පැහැති ජංගම දුරකථනය
26. ඒ. ආර්. 224/06	පී. ආර්. 199	අංක සී. ඊ. 168 අලුපාට නොකියා වර්ගයේ ජංගම දුරකථනය
27. 91988	පී. ආර්. 59	ජේ. වී. සී. වර්ගයේ වී. සී. ඩී. යන්ත්‍රය
28. 94167		ඩියුලක්ස් තීන්ත ටින් 01
29. 34408		බිත්ති ඔරලෝසුව
30. 73543		ජල කරාමය
31. 58566		අංක එස්. පී. ජී. ටී. 4681 ලොරි රථය
32. 27818		අංක 131-8385 දරන යතුරුපැදිය
33. 27562		අංකය අපැහැදිලි ස්පෝර්ට්ස් වර්ගයේ පාපැදිය
34. 37029		රැලේ වර්ගයට අයත් පාපැදිය
35. 41443		ඉස්කුරුප්පු නියන
36. 34407		කාර් කැසට් යන්ත්‍රය ත්‍රී රෝද රථ සඳහා භාවිතා කරන බ්‍රපලය හා එම ස්පීකර් 01
37. 31441		රැලි සායක්
38. 53517		අංකය අපැහැදිලි පා පැදිය
39. 27078		රතු පැහැති මවුන්ටන් වර්ගයේ පාපැදිය
40. 28584		ස්ටැන්ඩඩ් වර්ගයේ අංකය අපැහැදිලි පාපැදිය
41. ඒ. ආර්. 101/05	පී. ආර්. 41	එරික්සන් වර්ගයේ ජංගම දුරකථනය
42.	පී. ආර්. 40	ඇල්කටෙල් වර්ගයේ ජංගම දුරකථනය
43.	පී. ආර්. 42	රත් යැයි කියන කරාබු ජෝඩු 01
44.	පී. ආර්. 43	රත් පැහැති ඉමිටේෂන් මුදු 01
45. 41049		නූල් පන්දු 02

04-387

ආණ්ඩුවේ නොවන දැන්වීම්

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව දැන්වීම

ඉබ්බාගමුව තැපැල් කදුලව හි පදිංචි හේරත් මුදියන්සේලාගේ අයිරාංගනී කුමාරිහාමි හේරත් වන මම කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. ගුණතිලක මහතා විසින් 1996.10.01 වැනි දින ලියා සහතික කළ අංක 2892 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් දොඩම්ගස්ලන්ද තැපැල්, නව නගරයේ පදිංචි ලියනගේ දොන් මාර්කස් ස්ටැන්ලි නාතායක්කාර යන අයට මා වෙනුවෙන් ක්‍රියාකිරීමට දී තිබූ ඇටෝර්නි බලය 2007.01.18 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් එම ඇටෝර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිම ක්‍රියාවකට මා විසින් වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මීට,
හේරත් මුදියන්සේලාගේ අයිරාංගනී කුමාරිහාමි හේරත්.

04-388/1

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව දැන්වීම

ඉබ්බාගමුව තැපැල්, කදුලව, කොටුවත්ත ඉහගමම හි පදිංචි හේරත් මුදියන්සේලාගේ අයිරාංගනී කුමාරිහාමි හේරත් වන මම කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. ගුණතිලක මහතා විසින් 1997.07.21 වැනි දින ලියා සහතික කළ අංක 3365 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් දොඩන්ගස්ලන්ද තැපැල්, මාතලේ පාර, අංක 22 දරන ස්ථානයෙහි පදිංචි ලියනගේ දොන් මාර්කස් ස්ටැන්ලි නාතායක්කාර යන අයට, මා වෙනුවෙන් ක්‍රියාකිරීමට දී තිබූ ඇටෝර්නි බලය 2007.01.18 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් එම ඇටෝර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිම ක්‍රියාවකට මා විසින් වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මීට,
හේරත් මුදියන්සේලාගේ අයිරාංගනී කුමාරිහාමි හේරත්.

04-388/2

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

මහජන බැංකුව - මීගමුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මීගමුව කොන්දගම්මුල්ල ග්‍රාමයේ පිහිටි පදිංචියට සුදුසු වටිනා දේපළ, මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.05.07 දින පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

විශාලත්වය අක්කර 00 රූඩ් 01 පර්චස් 07කි

රජයේ ගැසට් පත්‍රයේ 2003.03.14 දින ද, දිනමිණ පුවත්පතේ 2003.03.27 දින ද, ඩේලිනිවිස් පුවත්පතේ 2003.03.27 දින ද, තිනකරන් පුවත්පතේ 2003.02.27 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.– මීගමුව සිට මිරිගම මාර්ගයේ සැතපුම් 04ක් පමණ දුරගිය පසු දෙමන් හන්දිය හමුවේ. එතැන් සිට මීටර් 100ක් පමණ දුරින් දකුණු පසට ඇති කොන්දගම්මුල්ල පල්ලිය පාරේ සැතපුම් 01ක් පමණ ගියවිට කොන්දගම්මුල්ල දේවස්ථානය හමුවේ. එතැනින් වම්පසින් ඇති ගුරු පාරේ මීටර් 75ක් පමණ ගියවිට හමුවන අතුරු පාරේ දෙවන බිම් කොටස.

ගෙවීමේ ක්‍රමය. – වෙන්දේසි අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශිය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 032-2253301, ෆැක්ස් අංක 032-2255247/ 032-2253300.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපියෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවීවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර,
මීගමුව.
දුරකථන අංකය 031-2223219
04-389/1

මහජන බැංකුව - මීගමුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකණුම් දැන්වීම

හලාවත-පල්ලම කොළඑලිය ග්‍රාමයේ පිහිටි පදිංචියට සුදුසු නිවසක් සහිත වටිනා දේපළ,

විශාලත්වය : රූඩ් 02, පර්චස් 20කි.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.05.08 දින පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ 2002.12.20 දින ද, දිනමිණ පුවත්පතේ 2004.08.26 දින ද, ඩේලිනිවිස් පුවත්පතේ 2004.08.26 දින ද, තිනකරන් පුවත්පතේ 2004.08.26 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසීම.– හලාවත පුත්තලම පාරේ බංගදෙනිය හන්දියෙන් පල්ලම පාරේ ගොස් පල්ලම නගරය පසුකර යනවිට දකුණුපස ඇති ගාමන්ට් එක ඉදිරියෙන් ඇති නන්දමිත්‍ර ගමට යන පාරේ සැතපුම් 1 1/2ක් පමණ ගිය විට හමුවන තාර පාරේ වමට හැරී යාර 200ක් පමණ දුරගිය විට කොළඑලිය පල්ලියට යාබදව දේපල පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. – වෙන්දේසි අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශිය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක: 032-2253301, ෆැක්ස් අංක : 032-2255247/ 032-2253300.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපියෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවීවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්,

අංක 22, ප්‍රනාන්දු පාර, මීගමුව.
දුරකථන අංක : 031-2223219
04-389/2

මහජන බැංකුව - මීගමුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මීගමුව නගර සභාව තුළ මහ හුණුපිටියේ පිහිටි පදිංචියට සුදුසු වටිනා දේපළ,

විශාලත්වය : පර්චස් 11.85කි

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.05.10 දින පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ 2004.12.31 දින ද, දිනමිණ පුවත්පතේ 2004.12.15 දින ද, ඩේලිනිවිස් පුවත්පතේ 2004.12.15 දින ද, තිනකරන් පුවත්පතේ 2004.12.15 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිළිවීම.– මීගමුව මීරිගම පාරේ ජීන් හන්දියෙන් ලාසරස් පාරට හැරී යාර 500ක් පමණ ගියවිට හමුවන වැලි පාරේ දකුණට හැරී ගියවිට යාර 100ක පමණ දුරින් ගෙඩනැගිල්ල සහිත දේපල හමුවේ.

ගෙවීමේ ක්‍රමය. – වෙන්දේසි අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 032-2253301, ෆැක්ස් අංකය : 032-2255247/ 032-2253300.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවිවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්,

අංක 22, ප්‍රනාන්දු පාර, මීගමුව.
දුරකථන අංක : 031-2223219
04-389/3

මහජන බැංකුව - මීගමුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මීගමුව තිඹිරිගස්කටුව ග්‍රාමයේ පිහිටි පඳිංචියට සුදුසු වටිනා දේපළ.

විශාලත්වය : අක්කර 00, රූඩ් 00, පර්චස් 20කි.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.05.11 දින පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ 2002.11.15 දින ද, දිනමිණ පුවත්පතේ 2002.11.06 දින ද, ඩේලිනිව්ස් පුවත්පතේ 2002.11.06 දින ද, තිනකරන් පුවත්පතේ 2002.11.06 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිළිවීම.– මීගමුව මීරිගම පාරේ ගොස් වයි. හන්දියෙන් වමට ඇති කටාන පාරේ මඳ දුරක් ගියවිට ඇති තිඹුරුගස්කටුව මහ විදුහල පාරේ යාර 25ක් පමණ ගිය විට පාරේ දකුණු පස දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. – වෙන්දේසි අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශිය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253301, ෆැක්ස් අංක : 032-2255247/ 032-2253300.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවිවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්,

අංක 22, ප්‍රනාන්දු පාර, මීගමුව.
දුරකථන අංක : 031-2223219
04-389/4

මහජන බැංකුව - මීගමුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මීගමුව කඳිරාන ග්‍රාමයේ පිහිටි පඳිංචියට සුදුසු නිවසක් සහිත වටිනා දේපළ.

විශාලත්වය : අක්කර 00, රූඩ් 00, පර්චස් 38.30කි.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.05.14 දින පෙ. ව. 11.00ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ 2006.10.27 දින ද, දිනමිණ පුවත්පතේ 2006.10.09 දින ද, ඩේලිනිව්ස් පුවත්පතේ 2006.10.10 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිළිවීම.– මීගමුව කටුවපිටිය දේවස්ථානය පසුකර කදිරාන දොන් ඩේවිට් මාවත මීටර් 200ක් පමන දුරින් වම්පස මෙම දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. – වෙන්දේසි අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශිය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253301, ෆැක්ස් අංක : 032-2255247/ 032-2253300.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවිවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්,

අංක 22, ප්‍රනාන්දු පාර, මීගමුව.
දුරකථන අංක : 031-2223219
04-389/5

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකුව මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ විකිණීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අගනා දේපළක් වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම්කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පිටිපන පිහිටි ඇතුගලලන්ද හා වංගෙඩිවෙල කුඹුර යන ඉඩමෙන් මැනන සාදන ලද අංක 1119 හා 1999.07.11 දින දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් අංක 9 කුඹු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට අදාළ පර්චස් 11.20 ප්‍රමාණයේ වටිනා දේපල වෙන්දේසිය.

දේපල විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේපත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පිටිපන පිහිටි ඇතුගලලන්ද හා වංගෙඩිවෙල කුඹුර යන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද 1999.07.11 දිනැති අංක 1119 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන පර්චස් එකොළහයි දශම දෙකයි බිංදුව (අක්. 0 රූ. 0 පර්. 11.20) ක විශාලත්වයක් ඇති ලොට් අංක 9 නමැති ඉඩමට මායිම් උතුරට ලොට් අංක 5 සහ 8, නැගෙනහිරට: ලොට් අංක 13 (අඩි 30ක් පළල මාර්ග රක්ෂිතය) දකුණට: ලොට් අංක 10, බස්නාහිරට: පැපොල් ගහෙන්න යන මායිම් ඇතුළත පිහිටි ඉඩම හා ගොඩනැගිලි, ගස්, වැවිලි හා අන් සියලු දේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1202/236 යටතේ ලියාපදිංචි වී ඇත.

පහත විස්තර කරන ඉඩම් මත හා දිගේ මාර්ග අයිතිය හා සෙසු පරවශතාවන් සමග ඉහත පිටිපන පිහිටි ඇතුගලලන්ද හා වංගෙඩිවෙල කුඹුර යන ඉඩමෙන් මැන සාදන ලද අංක 1119 දරන පිඹුරේ දැක්වෙන බිම් කට්ටිය වන රූඩ් දෙකක හා පර්චස් හතයි දශම තුනයි තුන (අ. 0 රූ. 2 පර්. 7.33) ක විශාලත්වයක් ඇති ලොට් අංක 13 (අඩි 30ක් පළල මාර්ග රක්ෂිතය) නමැති ඉඩමට මායිම් උතුරට : ලොට් අංක ඩී 2, 3, 21, 36, 35, 34, 55, 45 – 48 නැගෙනහිරට : ලොට් අංක 55, 21 – 25, 30 හා වීසී පාර, දකුණට : ලොට් අංක 44, 43, 2, 41, 40, 39, 32, 20 හා 19 බස්නාහිරට : ලොට් අංක 16, 15, 14, 12, 11, 10, 9, 8 හා 6 මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1202/237 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම දේපල ජාතික ඉතිරි කිරීමේ බැංකුවට උකස් තබා ඇත්තේ පන්නිපිටිය, නියඳගල, අංක 87/4 පදිංචි ඩබ්. කේ. එන්. පෙරේරා මෙනවිය විසිනි.

දේපොලට ළඟාවීම.–කොට්ටාව නගරයේ සිට හොරණ පාර (මාර්ග අංක 280) දිගේ කිලෝමීටර් 11ක් ගියතැන විවේකාරාම පන්සල් හන්දියේ ඇති ගල් එලා තාර දමන ලද මාර්ගයට එළැඹෙනු ඇත. අනතුරුව මේ පාරට වමට හැරී පාර දිගේ මීටර් 200ක් පමණ ගිය තැන පාරේ වම්පසින් ඇති ප්‍රධාන ඉඩමට පිවිසිය හැක. කට්ටි කළ ඉඩමට ළඟාවීම සඳහා මීටර් 09ක් පළල ඇතුළු පාර දිගේ මීටර් 150ක් පමණ ඉදිරියට ගොස් වම් අත පැත්තෙන් දකුණට හැරෙන්න.

මෙම දේපල අප විසින් 2007 මැයි මස 10 බ්‍රහස්පතින්දා පෙ. ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ඊට අයත් සියලු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිම වූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25%ක්,
2. ගැණුම් මිලෙන් 1%ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතුය.
3. ගැණුම් මිලෙන් 2 1/2%ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය.
4. සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදම රු. 81,882.00,
5. ලිපිකරුගේ හා සෝෂකකරුගේ ගාස්තුව රු. 500,
6. වෙන්දේසිය සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 3,000,
7. විකුණුම් කොන්දේසි ගාස්තුව රු 750.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75% ක මුදල, වෙන්දේසි දින සිට දින 30ක් තුළ බැංකුව වෙත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (ණය) ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2576132.

ඡොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

ප්‍රධාන කාර්යාලය :	*අගනුවර කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,	අංක 290, හැව්ලොක් පාර,
මහනුවර	කොළඹ 05
දුරකථන අංක : 081-2224371	දුරකථන අංක : 94 (0) 112585408
081-2227593	2502680
ෆැක්ස් :අංකය 081-2224371	ෆැක්ස් අංක 94 (0)11 2588176.
ඊමේල් :samera@diamond.lank.a.net	ඊමේල්:samera@srilanka.net

04-304

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකුව මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ විකිණීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අගනා දේපළක් වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ කටුගම්පොල කෝරළේ (දකුණ) දණ්ඩගමුව පිහිටි "ගම්මාසම්හේන" යන ඉඩමෙන් මැන සාදන ලද 1982.05.01 දිනැති අංක 99 දරන පිඹුරේ දැක්වෙන බෙදාවෙන් කළ බිම් කට්ටිය වන රූඩ් එකක විශාලත්වය ඇති ලොට් අංක 03 නැමැති වටිනා දේපොල වෙන්දේසිය.

දේපල විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පළ කෝරළේ (දකුණ) කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ දණ්ඩගමුව ගමේ පිහිටි ගම්මාසම් හේන යන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. එච්. කොල්ලුරේ විසින් මැන සාදන ලද 1982.05.01 දිනැති අංක 99 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන 'කළ බිම් කට්ටිය වන රූඩ් එකක (අ. 0 රූ. 01 පර්. 0) විශාලත්වය ඇති ලොට් අංක 03 නැමැති ඉඩමට මායිම්, උතුරට : පී. බී. ආරොත් සිංඤෝ නැමැති අය විසින් අයිතිවාසිකම් කියන කණ්ඩුකැටිය පිල්ලැවද, නැගෙනහිරට : ලොට් අංක 04 ද, යන මායිම් ඇතුළත පිහිටි ඉඩම හා ගොඩනැගිලි, ගස් වගාවන් ඇතුළු එහි පිහිටි සියලු දේ මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 153/35 යටතේ ලියාපදිංචි වී ඇත. ඉහත කී අංක 99 දරන පිඹුරේ දැක්වෙන රක්ෂිතය මත හා දිගේ මාර්ග අයිතිය සමග,

මෙම දේපල ජාතික ඉතිරි කිරීමේ බැංකුවට උකස් තබා ඇත්තේ කුලියාපිටිය, දණ්ඩගමුව, හම්මලවල පාර පදිංචි ඩී. ජී. බී. එම්. ඒ. බන්නැහැක මහතාය.

දේපොලට ළඟාවීම.–කුලියාපිටිය, මීගහකොටුව හන්දියේ සිට පන්නල පාර දිගේ කිලෝමීටර් 01ක් පමණ ගියතැන හමුවන දණ්ඩගමුව පන්සල හන්දියෙන් වමට හැරී පන්සල වෙත දිවෙන තාර පාර දිගේ මීටර් 150ක් පමණ ඉදිරියට යන්න. දණ්ඩගමුව " සණස" කාර්යාලය පසු කළ විටම වම් පසින් ඇති හම්මලව පාර (බොරළු පාර) ට හැරී මීටර් 200ක් පමණ ගියතැන පාරේ වම්පස පාරට මුහුණලා මෙම දේපල පිහිටා ඇත.

මෙම දේපල 2007 මැයි මස 16 බදාදා පෙ. ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේදී ඊට අයත් සියලු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිම වූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25%ක්,
2. ගැණුම් මිලෙන් 1%ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතුය.
3. ගැණුම් මිලෙන් 2 1/2%ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය.
4. සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදම රු. 55,500,
5. ලිපිකරුගේ හා සෝෂකකරුගේ ගාස්තුව රු. 500,
6. වෙන්දේසිය සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 3,000,
7. විකුණුම් කොන්දේසි ගාස්තුව රු. 750.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75% ක මුදල, වෙන්දේසි දින සිට දින 30ක් තුළ බැංකුව වෙත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා, සහකාර සාමාන්‍යාධිකාරී (ණය) නිවාස ණය අංශය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකය : 011-2576132.

ඡොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

ප්‍රධාන කාර්යාලය :	*අගනුවර කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,	අංක 290, හැව්ලොක් පාර,
මහනුවර	කොළඹ 05
දුරකථන අංක : 081-2224371	දුරකථන අංක : 94(0)11 2585408
081-2227593	2502680
ෆැක්ස් අංකය :081-2224371	ෆැක්ස් අංක : 94 (0)11 2588176.
ඊමේල් :samera@diamonk.land.a.net	ඊමේල් : samera@srilanka.net

04-305

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – මාතර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. සෙනෙරත් විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 1999.02.10 දින සහ අංක 2026 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ආඩම්බරගේ අනුර ද අල්විස් සහ නම්බුකාර වසම් ප්‍රසිලා පද්මිණී සමරනායක යන අය ණයකරුවන් හැටියට පැහැර ඇති හෙයින් දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර හා නගර සභා සීමාව තුළ පොල්හේනේ පිහිටි පොල්හේන පාරේ, වරිපනම් අංක 60 ඒ (පරණ අංක 63) දරන පිහිටි තත්තිරිගේ වත්තෙහි ලොට් 1 නමින් හඳුන්වන ඉඩම සහ ඊට අයත් සියලු ගොඩනැගිලි වැවිලි පස් ආදී සියළු දේත් සමග වේ.

විශාලත්වය පර්චස් 14. 875

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේ දී 2007 මැයි මස 08 වැනි දින පෙ. ව. 10.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.01.19 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2007.02.08 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය. :

01. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%)ක් ද,
04. ලිපිකරු හා ඝෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
05. සියලුම ප්‍රචාරක වියදම්,
06. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (2,000)ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, මාතර ශාඛාව (දුරකථන අංක 041-2222588) හෝ කොළඹ 10, ටී. බී ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්) දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. ටී. එල්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32, නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.
04-405

බදුල්ල දිසා අධිකරණයේ දී ය

සංගර අරුණවලම් පලනිවේල් ආලමූර්ති,
අංක සී/115,
බදුලුපිටිය,
බදුල්ල.

නඩු අංකය පී 278

.....පැමිණිලිකරු

එදිරිව

01. ආලයමූර්ති ජෙගදස්වරම්,
යූරිවත්ත, පස්සර
02. එස්. සුන්දරලිංගම් බාරේ,
ආලමූර්ති නිරංජනී,
මාපාගල කොටස,
යූරියවත්ත, පස්සර.
03. ආලයමූර්ති රාමමූර්ති,
අංක 16, යෙල්වටත් වතුයාය,
හාලි ඇල.
04. ආලයමූර්ති සුන්දර මූර්ති සහ
සුන්දර මූර්ති නිර්මලා,
අංක, සී/115,
බදුළුපිටිය, බදුල්ල.

.....විත්තිකරුවෝ

වර්ෂ 2006ක් වූ ජූලි මස 27 වැනි දින බදුල්ල දිසා විනිසුරු තුමා විසින් අතුරු තීන්දු ප්‍රකාශයකට පත් කරන ලද තීන්දුව ප්‍රකාරව පාර්ශවකරුවන් පස්දෙනෙකු අතර බෙදුමට තරම් ප්‍රමාණවත් දේපලක් නොවන බැවින් එම දේපල වෙළඳ වටිනාකම අනුව රු. 860,000 ඉහළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියෝග කර ඇති හෙයින් බදුල්ල දිසා අධිකරණය මගින් නිකුත් කරන ලද විකිණීමේ නියෝගය ප්‍රකාරව මා වෙත පවරා ඇති අධිකාරි බලය පිට 2007 ක් වූ මැයි මස 22 වැනි දින එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉතා වටිනා පඳිංචියට සුදුසු දේපලක්

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල නගරයේ කඩවත් සතර තුළ බදුල්ල ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසයේ, බදුල්ල නැගෙනහිර වසමේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බදුලුපිටිය ගමේ පිහිටියා වූ බදුළුපිටිය, පාරේ වරිපනම් අංක සී /115 දරන්නාවූ එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර මහතා විසින් පිළියෙල කරන ලද අංක 125 සහ 1979 සැප්තැම්බර් ඔක්තෝබර් දින දරන පිඹුරේ කැබැලි අංක 93 දරන කැබැල්ල වශයෙන් විස්තර කරනු ලැබ ඇත්තාවූ ද උතුරට : එම පිඹුරේ කැබැලි අංක 80න් ද, නැගෙනහිරින් : මහ නගර සභා ඉඩමින් ද, දකුණට : එම පිඹුරේ කැබලි අංක 94න් ද, බස්නාහිරින් : පාර දිගේ වෙන් කරන ලද බිම් තීරුවෙන් ද, මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම එකයි බින්දුවක් (අ. 0 රූ. 0 පර්. 06.10) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ඉහත කී වරිපනම් අංක සී 115 දරන නිවස ඇතුළු සෑම සියලු දේන් සමග වේ.

මෙම ඉඩම සඳහා මෙම නඩුවට "X" වශයෙන් ලකුණු කොට ගොණුකර ඇති අවසරලත් මානක එම්. පී. ගුණරත්න මහතා විසින් 2005 ක් වූ ජනවාරි මස 26 වැනි දින මැන සාදන ලද අංක 2045 දරන පිඹුරු සටහන අනුව, උතුරට වර්ජිතා උම්මා හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට බී. බී. පාතිමා සහ තවත් අයවලුන් හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට ෂාවුල් හමීඩ් හිමිකම් කියන ඉඩමින් ද, සහ බස්නාහිරට පාර දිගට ඇති රක්ෂිතයෙන් ද මායිම් වූ පර්චස් හයකුත් දශම දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 06.25) විශාලත්වය ඇති බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිල්ල ඇතුළු සෑම සියලු දේත් සමග වේ.

මෙම දේපල බදුල්ල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඒ. 86/87 හා ඒ 100/92 පත්තිරුවල ලියා පඳිංචි කර ඇත.

ඉඩමට පිවිසීම.– බදුල්ල නගරයේ සිට වින්සන් ඩයස් ක්‍රීඩාංගනය අසලින් කනත්තට ගමන් කරන (මල්වත්තට යාබදව) මාර්ගයේ කිලෝ මීටර් 1/2ක් පමණ ගමන් කර වතුර ටැංකිය අසලින් පළමු පටු මගින් ඉඩමට පිවිසිය හැක. (අංක සී 115, බදුලුපිටිය, බදුල්ල)

ගෙවීමේ ක්‍රමය.– ගැණුම්කරු තීරණය කල වහාම වැඩිම ඉල්ලුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් (සියයට විසිපහක්) 25%,
2. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් ගැණුම් මිලෙන් සියයට 2 1/2%ක්,
3. පළාත් පාලන ආයතනයට (සියයට එකක්) 01%ක්,
4. විකිණීම සඳහා වැය වූ සියලුම ප්‍රචාරක වියදම් ද,
5. ගැණුම් මිලෙන් ඉතිරි (සියයට හැත්තෑ පහ) 75% මුදල විකිණීමේ දින සිට දින 07ක් ඇතුළත දී අදාල නඩුවේ බැරට බදුල්ල දිසා අධිකරණයට ගෙවා නිම කළ යුතු වේ.

සාමවිනිසුරු,
ඩබ්. ජයතිලක,
උසාවි කොමසාරිස් ප්‍රසිද්ධ
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 48/1, කළුගල්පිටිය,
බදුල්ල.
දුරකථන අංක 055-2230846
04-384

බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්
බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්
අංක 28, සෙන්ට් මයිකල්ස් පාර,
කොළඹ 03 සහ
(කලින් අංක 189, ගාලු පාර, කොල්ලුපිටිය)

.....පැමිණිලිකරු.

නඩු අංක : එච්. සී (සිවිල්) 40/2004(1)
වටිනාකම :මිලියන 25.0
උකස්කර : උකස්කර
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

එදිරිව

හික්කඩුව ලියනගේ ප්‍රැන්සිස්,
අංක 300/8, තලවතුගොඩ පාර,
මාදිවෙල,
කෝට්ටේ.

.....විත්තිකරු.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ නියෝගය අනුව පැමිණිලිකරුගේ වාසියට විත්තිකරුගෙන් පැමිණිල්ලේ ආයාචනයේ ඇය ද, ඇති පරිදි රුපියල් හැත්තෑ පන්ලක්ෂයක් (රු. 75,00,000) මුදලක් ඒ මුදල මත වර්ෂ 1996ක් වූ පෙබරවාරි මස 13 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් වර්ෂයකට සියයට විසිපහක (25%)අනු ප්‍රමාණයක් අනුව වූ පොලියක් ද සමග පැමිණිලිකරුට ඉහත විත්තිකරුගෙන් අයකර ගැනීමට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

මෙහි වූ පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කොට ඇති මුළු ඉඩම් කැබැල්ලක් ද, ඒ මත පිහිටි ගොඩනැගිලි ද, එයට අයත් හෝ සම්බන්ධ සියලු අයිතිවාසිකම් ද එය විෂයෙහි එයින් හෝ ඒ මත විත්තිකරුගේ සියලු ඉඩකඩම්, අයිතිවාසිකම්, හිමිකම් දේපල හිමිකම් පැමි හා ඉල්ලීම් ද සමග ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඒ. අත්තනායක මහතා විසින් ලියා අත්සන් කරන ලද අංක 224 හා වර්ෂ 1994.03.01 වැනි දින දරන උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාර ඉහත කී මුදල් අයකර ගැනීම අරඹයා බැඳී ඇති බවට හා ක්‍රියාවේ යෙදවීමට සහ ඉහත කී මුදල් අයකර ගැනීම පිණිස උකස් බැඳුම්කරය ක්‍රියාවේ යෙදවීමට පැමිණිලිකරු හිමිකම් ලබන බවට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්ද,

සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත් බද මහාධිකරණයේ අංක එච්. සී. (සිවිල්) 40/2004 (1) දරන නඩුවෙන් මා වෙත පවරන ලද කොමිසම මත පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් දේපල වර්ෂ 2007ක් වූ මැයි මස 29 වැනි දින පෙරවරු 11.00 ට අදාල දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ බටකැත්තර පිහිටියාවූ ද, උතුරින් ගම් සහා පාරෙන්, නැගෙනහිරින් අංක 2 බිම් කැබැල්ලෙන්, දකුණින් අංක 6 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් එම ඉඩමේ ම කොටසකින් මායිම් වූ ද බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් සාදන ලද අංක 320 සහ 1992.11.10 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දොළහයි. දශම හයයි පහක් (අ. 0 රූ. 0 පර්. 12.65) *නැනහොත්* හෙක්ටයාර් 0.0320 කින් යුක්ත වූද, පෙර කොළඹ සහ දැනට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි එම්. 1964/146 හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද අලුබෝගහලන් ද හා කෝන්ගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 320 දරන පිඹුරේ නිරූපිත අංක 1 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කොටස වේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ බටකැත්තර පිහිටියාවූ ද, උතුරින් ගම් සහා පාරෙන්, නැගෙනහිරින් අංක 17 බිම් කැබැල්ලෙන්, දකුණින් අංක 6 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් අංක 1 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් සාදන ලද 320 හා 1992.11.10 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශ ම නවයයි තුනකින් (අ. 0 රූ. 0 පර්. 12.93) *නැනහොත්* හෙක්ටයාර් 0.0327 කින් යුක්තවූ ද, අලුබෝගහලන්ද හා කෝන්ගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 320 දරන පිඹුරේ නිරූපිත අංක 2 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කොටස හා ඒ මත පිහිටි සියලු දේ ද, 37 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති හා අංක 320 දරන එකී පිඹුරේ නිරූපිත පාරක් සඳහා වෙන් කරන ලද භූමිය පාරෙන් හා ඒ මතුපිටින් එයට සමාන අයිතිවාසිකම් ඇති වෙනත් තැනැත්තන් සමග පොදුවේ භාවිතා කරනු ලබන මාර්ග අයිතිය හා වෙනත් අයිතිවාසිකම් ද සමග වේ.

ඉහත විස්තර කොට ඇති අංක 1 හා 2 දරන බිම් කැබලි, ඉහත කී බටකැත්තර පිහිටියාවූ ද, උතුරින් ගම් සහා පාරෙන්, නැගෙනහිරින් එම ඉඩමේ ම කොටසකින් සහ ඩී . ගිරින් පෙරේරා හා වෙනත් තැනැත්තන් විසින් හිමිකම් දක්වා සිටින දේපළින්, දකුණින් බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් සාදන ලද අංක 297 හා 1997.09.02 වැනි දින දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් එම ඉඩමේම කොටසකින් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් සාදන ලද අංක 317 හා 1992.10.23 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් තිස් අටයි දශම අටකින් (අ. 2 රූ. 0 පර්. 38.8) යුක්ත වූ ද, පෙර කොළඹ සහ දැනට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි එච්. 1882/09 හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, අලුබෝගහලන්ද හා කෝන්ගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 317 දරන පිඹුරේ නිරූපිත අංක 1 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති බෙදා වෙන් කරන ලද නිශ්චිත මුළු ඉඩම් කොටසින් බෙදා වෙන් කරන ලද නිශ්චිත කොටස් වන්නේ ය.

දේපලට පිවිසීම.– පිළියන්දල නගරයේ සිට කැස්බෑව දෙසට මීටර් 500ක් ගියවිට හමුවන පුවක්ගස් හඳියෙන් දකුණට ඇති මඩපාත පාරේ සැතපුම් 2ක් ගියවිට හමුවන නිල්කමල් කර්මාන්ත ශාලාවෙන් වමට ඇති බටකැත්තර මාර්ගයේ මීටර් 300ක් ගියවිට දකුණ පස අදාල දේපල පිහිටා ඇත. දේපල උතුරු දෙසින් මාකඳුරට යන මාර්ගයක්, ඊසාන දෙසින් මීටර් 6ක් පළලැති සාන්ත මයිකල් උද්‍යානයට යන මාර්ගයත් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.– මිටිය පහත හෙලූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් එවලේ ම මුදලින් ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් 25%ක් (ආපසු ගෙවනු) නොලබන (2) පළාත් පාලන බදු වශයෙන් 1% (3) වැට් බද්ද 15% (4) වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2%යි (5) තක්සේරු ගාස්තු සහ වෙන්දේසිය සඳහා වැයකළ මුදල් (*ගැසට්, පුවත්පත් දැන්වීම්* සහ අනෙකුත් වියදම් (6) විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 3,000ක් (7) ලිපිකරු සහ ඝෝෂක ගාස්තු 2,000 (8) අධිකරණයට ගෙවිය යුතු පවුන්ඩේජ් ගාස්තු 1/2% (9) ගැනුම් මිලෙන් ඉතිරි 75% ක මුදල වෙන්දේසියේ දින සිට දින 30ක් තුළ දී වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා කළමනාකරු, මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්, බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්, අංක 28, සෙන්ට් මයිකල් පාර, කොළඹ 03.

දුරකථන අංක : 4711711.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 2696155, 2572940
04-398

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 137

DIRF/RECT/86(VI)AY.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව– ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

පහත නම සඳහන් මහත්මිය 2004 අප්‍රේල් මස 30 වන දින සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ ලුතිතන් කර්නල් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය වෙත ඇතුළත් කිරීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

විශේෂඥ වෛද්‍ය නිලධාරිනී – ලුතිතන් කර්නල් ගීතිකා මුදානි ජයවීර (නි/67094)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.
04-350

2007 අංක 138

DIVF/RECT/49AV.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

අතිගරු ජනාධිපති උතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2005 ජුනි 25 වන දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙලට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම හා එදිනම සිට දක්වා ඇති රෙජිමේන්තු/බලකා වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමන් විසින් අනුමත කර ඇත.

(අ) කෙඩෙට් නිලධාරී - මහමුදලිගේ අමිල මයන්ත - ගැමුණු හේවා බළඇණිය (ස්වේච්ඡා)
(ආ) කෙඩෙට් නිලධාරී - හේවා වලිමුණිගේ වසන්ත රණසිංහ - සන්නද්ධ බුද්ධි බලකාය (ස්වේච්ඡා)
(ඇ) කෙඩෙට් නිලධාරී - අරුණ කිරින්ද හේවගේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඈ) කෙඩෙට් නිලධාරී - බමුණුසිංහ ආරච්චිලාගේ දොන් නුවන් දේශප්‍රිය සෙනෙවිරත්න ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව (ස්වේච්ඡා)
(ඉ) කෙඩෙට් නිලධාරී - එදිරිසූරිය මුදියන්සේලාගේ වසන්ත සංජීව එදිරිසූරිය - ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඊ) කෙඩෙට් නිලධාරී - දම්සේවත්තේ ආරච්චිලාගේ නුවන් චූලා රූපසිංහ - විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(උ) කෙඩෙට් නිලධාරී - එදිරිසිංහ පේඩිගේ සුරේෂ් තරංග ජයසිංහ - ශ්‍රී ලංකා පාබල හමුදාව (ස්වේච්ඡා)
(ඌ) කෙඩෙට් නිලධාරී - දොඹහපතිරගේ කළණ ජයබුද්ධික පීරිස් - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(එ) කෙඩෙට් නිලධාරී - කුලතුංග මුදියන්සේලාගේ ගැමුණු අමරනායක - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ඒ) කෙඩෙට් නිලධාරී - ගනේගොඩගේ නයන කාන්ත ලක්මාල් කුමාර ගනේගොඩ - විජයබාහු පාබල රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ඔ) කෙඩෙට් නිලධාරී - හංගමුව මොහොට්ටි ගයාන් චාම්කර - ගැමුණු හේවා බළඇණිය (ස්වේච්ඡා)
(ඕ) කෙඩෙට් නිලධාරී - වැවල රණවකගේ බුද්ධික ප්‍රදීප් කුමාර රණවක - ගජබා රෙජිමේන්තුව (ස්වේච්ඡා)
(ක) කෙඩෙට් නිලධාරී - ජයලත් ආරච්චිලාගේ නන්දන රුවන් කුමාර හේරත් - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ග) කෙඩෙට් නිලධාරී - මෙවන් මංජු ශ්‍රී කන්දෙආරච්චි - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව (ස්වේච්ඡා)
(ජ) කෙඩෙට් නිලධාරී - විරද්දන විරාජ් සිවන්ත ද සිල්වා - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ච) කෙඩෙට් නිලධාරී - බොරළුවේ රත්නායක මුදියන්සේලාගේ නුවන් බංඩාර රත්නායක - ශ්‍රී ලංකා පාබල හමුදාව (ස්වේච්ඡා)
(ට) කෙඩෙට් නිලධාරී - මිල්ලෙහේනේ ගෙදර අකලංක උදේෂ් මිල්ලෙහේනේ - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ඩ) කෙඩෙට් නිලධාරී - නුවන් තිවංක නාවලගේ - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(න) කෙඩෙට් නිලධාරී - විජේකෝන් මුදියන්සේලාගේ ප්‍රමිත නාමල් බංඩාර හංපරාව - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
(ප) කෙඩෙට් නිලධාරී - ලොකු කංකානම්ගේ රොෂාන් කුලරත්න පීරිස් - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව (ස්වේච්ඡා)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.
04-349

2007 අංක 139

D/RF/824/NY/04/04.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2006 සැප්තැම්බර් මස 01 වන දින සිට රියර් අද්මිරාල් වශයෙන්.–

කොමදෝරු පෙටහන්දි ලක්ෂ්මන් නානප්‍රසාද් ඔබේසිංහ, යූඑස්පී, පීඑස්සී – එන්ආර්එක්ස් – 0099

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.
04-357

2007 අංක 140

D/22/NY/380.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2006 දෙසැම්බර් මස 07 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

රියර් අද්මිරාල් ලෙස්තුරුගේ දයානන්ද ධර්මප්‍රිය, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, – එන්ආර්එක්ස් 0056

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.
04-353/1

2007 අංක 141

D/22/NY/380.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 දෙසැම්බර් මස 07 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.

රියර් අද්මිරාල් ලෙස්තුරුගේ දයානන්ද ධර්මප්‍රිය, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, – එන්ආර්එක්ස් 0056

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.
04-353/2

2007 අංක 142

D/RF/824/NY/03/02.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2006 ජූලි මස 01 වන දින සිට කපිතාන් (සිඉ) වශයෙන්.–

කොමාණ්ඩර් (සිඉ) [තාවකාලික කපිතාන් (සිඉ)] යාපා මුදියන්සේලාගේ අජන්ත ගාමිණී යාපා, ශ්‍රීලංකාව – එන්ආර්පී 0187

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.
04-351

2007 අංක 143

D/RF/824/NY/03/02.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2006 ජනවාරි මස 01 වන දින සිට තාවකාලික කපිතාන් වශයෙන්.–

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) නිරාජ පණ්ඩුල ශ්‍රීපති ආටිගල, ආර්එස්පී, පීඑස්සී – ශ්‍රීලංකාව – එන්ආර්එක්ස් – 0256

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) සමරවීර මුදලිගේ දොන් කපිල සමරවීර, ආර්එස්පී – ශ්‍රීලංකාව – එන්ආර්එක්ස් – 0254

කොමාණ්ඩර් (සංඥා) අගලවත්ත අශෝක ප්‍රින්ස්ලි ලියනගේ, ආර්එස්පී, පීඑස්එන් – ශ්‍රීලංකාව – එන්ආර්එක්ස් 0341

කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) ප්‍රියංක මෙරිල් වික්‍රමසිංහ, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී – ශ්‍රීලංකාව – එන්ආර්එක්ස් 0260

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.
04-356

2007 අංක 144

D/22/NY/377.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.–

කොමාණ්ඩර් (නාසෙ) මනමේන්ද්‍ර ආචරිගේ නිහාල් චන්ද්‍රසිරි, එන්ආර්පී 0379, ශ්‍රීලංකාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.
04-361

2007 අංක 145

D/RF/832/NY.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ක්ෂේත්‍ර උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියා 2006 මැයි මස 11 වන දින සිට කොමාණ්ඩර් (සීඩීඕ) වශයෙන්.–

ලුතිනන් (සීඩීඕ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සීඩීඕ)] එදිරිප්පුලිගේ ලලිත් ප්‍රසන්න එදිරිසිංහ, එන්ආර්එක්ස් 0917 ශ්‍රීලංකාව

පහත නම සඳහන් නිලධාරියා 2006 මැයි මස 11 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්.–

ලුතිනන් රත්නායක මුදියන්සේලාගේ දිනේෂ් හර්ෂජීව සම්පත් රත්නායක, එන්ආර්එක්ස් 1621 ශ්‍රීලංකාව

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූනි මස 07 වැනි දින,
කොළඹ දී ය.
04-355

2007 අංක 146

D/22/NY/391.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2007 ජනවාරි මස 31 වැනි දින සිට කොමාණ්ඩර් වශයෙන් :–

ලුතිනන් කොමාණ්ඩර් (තාවකාලික කොමාණ්ඩර්) තාවකාලික කොමාණ්ඩර් ගමගේ ආරච්චිගේ අජිත් උදයාන විජයසේකර, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලංකාව, එන්ආර්එක්ස් 0265

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.
04-362/2

2007 අංක 147

D/RF/751/RECT/NY/14.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද ක්ෂේත්‍ර උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 ජනවාරි මස 01 වන දින සිට තාවකාලික කොමාණ්ඩර් (එච්) වශයෙන් :-

ලුතිනන් කොමාණ්ඩර් (එච්) අශෝක විජේසිරිවර්ධන, ශ්‍රීලංකාව, එන්ආර්එක්ස් 0496

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූනි මස 07 වැනි දින,
කොළඹ.
04-366

2007 අංක 148

D/22/NY/391.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරියා නාවික හමුදා සේවය සඳහා වෛද්‍ය හේතූන් මත නුසුදුසු වීම නිසා 2007 පෙබරවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ස්ථිර බලකායේ විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

තාවකාලික කොමාණ්ඩර් ගමගේ ආරච්චිගේ අජිත් උදයාන විජයසේකර– ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලංකාව – එන්ආර්එක්ස් – 0265

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ.
04-362/1

2007 අංක 149

D/22/NY/373.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2006 ජූලි මස 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

වෛද්‍ය ලුතිනන් නිශාන්ත පුෂ්පකුමාර අබේදිර, ශ්‍රීලංකාව, එන්ආර්එම් 1324

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 16 වැනි දින,
කොළඹ.
04-352

2007 අංක 150

D/22/NY/375.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් හා නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 15 වන දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැනීම සහ එදින සිට නිත්‍ය නාවික උපසේවය වෙත මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (නාසෙ) ගුණරත්නගේ සෙනරත් ජයවර්ධන, එන්ආර්පී 0989 ශ්‍රීලංකාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූලි මස 31 වැනි දින,
කොළඹ.
04-358

2007 අංක 151

D/22/NY/382.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2006 සැප්තැම්බර් මස 25 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

උප ලුතිනන් තල්ගස් දූවගේ ප්‍රභාත් චන්දික, එන්ආර්එම් 1610, ශ්‍රීලංකාව

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ.
04-354

2007 අංක 152

D/VF/193/NY.

ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්වේච්ඡා නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2006 ජනවාරි මස 01 වන දින සිට කපිතාන් (ස්වේච්ඡා)වශයෙන්.–

කොමාණ්ඩර් (ස්වේච්ඡා) [තාවකාලික කපිතාන් (ස්වේච්ඡා)] විතාරනගේ ජයරත්න – එන්වීඑක්ස් 5035

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ.
04-365

2007 අංක 153

D/VF/219/NY.

ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාව

ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2005 අගෝස්තු මස 31 වන දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්වේච්ඡා නාවික හමුදාවේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (ස්වේ) සාලිය කුමාර විරසිංහ, ශ්‍රීලංකාස්වේහ, එන්වීඑක්ස් 5036

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ.
04-363

2007 අංක 154

D/VF/193/NY.

ශ්‍රී ලංකා නාවික හමුදාව –ස්වේච්ඡා නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2006 පෙබරවාරි මස 17 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්.–

ලුතිනන් බ්‍රැන්ඩ් ගම්පලගේ ශ්‍රියාණී මංගලිකා පෙරේරා. එන්වීඑස් 5171 ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූලි මස 06 වැනි දින,
කොළඹ.
04-367

2007 අංක 155

D/VF/218/NY.

ශ්‍රී ලංකා නාවික හමුදාව –ස්වේච්ඡා නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීමක්

2006 අගෝස්තු මස 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) ජෝශප් පෙරියතම්බි, ශ්‍රීලංස්වේනාහ, එන්වීඑක්ස් 5243

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 30 වැනි දින,
කොළඹ.
04-364

2007 අංක 156

D/VF/220/NY.

ශ්‍රී ලංකා නාවික හමුදාව –ස්වේච්ඡා නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්

2006 සැප්තැම්බර් මස 21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) පොලියත්ත කුමාරගේ ධර්මදාස, ශ්‍රීලංස්වේනාහ. එන්වීඑක්ස් –5323

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ.
04-368

වෙනත් පත්කිරීම් ආදිය

2007 අංක 157

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත් කිරීම්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ ඒ. ආර්. ගුණවර්ධන මහතා 2006.08.31 දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ධීවර සමාජ සංවර්ධන වශයෙන්)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ බී. එම්. එස්. බණ්ඩාර මහත්මිය 2006.05.17 දින සිට නැවත නියමයන් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ඩබ්. යූ. පී. ප්‍රේමචන්ද්‍ර මහතා 2006.07.13 දින සිට නැවත නියමයන් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ ඩී. එන්. වීරකෝන් මහත්මිය 2006.09.29 දින සිට නැවත නියමයක් කරන තුරු ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා මණ්ඩලයේ සහ වාස්තු විද්‍යාඥ සේවා මණ්ඩලයේ ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පී. නාමගල් මහත්මිය 2004.09.01 දින සිට නැවත නියමයන් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එන්. සිවලිංගම් මහතා 2004.09.01 දින සිට නැවත නියමයන් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ආර්. රුෂාන්දන් මහතා 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ යූ. ජී. ආර්. ආරියරත්න මහතා 2004.09.13 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ටී. එම්. ජේ. ඩබ්. තෙන්නකෝන් මහතා 2004.11.17 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එච්. ඒ. එස්. ප්‍රනාන්දු මහතා 2005.03.01 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ බී. එන්. ලියනගේ මෙනවිය 2005.10.10 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂවරියක් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එච්. ඩී. සී. ජානකී මහත්මිය 2006.02.16 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඩී. විදානගමාච්චි මහතා 2006.02.20 දින සිට නැවත නියමයක් කරන තුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කේ. වී. අතුල මහතා 2006.03.01 දින සිට නැවත නියමයක් කරන තුරු ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කේ. එම්. බී. ටී. කරුණාසේන මහත්මිය 2006.04.03 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ආයතන අධ්‍යක්ෂවරියක් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එච්. එම්. එම්. කේ. දයාරත්න මහත්මිය 2006.05.16 දින සිට නැවත නියමයන් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එස්. එම්. එස්. ඩී. ගුණසිංහ මහතා 2006.07.11 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කේ. ජී. විජේසිරි මහතා 2006.07.18 දින සිට නැවත නියමයක් කරන තුරු අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ජී. ජී. එස්. සී. රෝෂන් මහතා 2006.08.07 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ එච්. ඒ. එස්. ප්‍රනාන්දු මහතා 2006.08.08 දින සිට නැවත නියමයක් කරන තුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ජී. එම්. ජෝසියස් මහතා 2006.09.06 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ආයතන අධ්‍යක්ෂවරයෙක් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ සමන්ති රණසිංහ මහත්මිය, 2006.09.11 දින සිට නැවත නියමයක් කරන තුරු, අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ පී. පී. එස්. ආර්. ද සිල්වා මහතා 2006.09.12 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ බී. එච්. එන්. ජයවික්‍රම මහතා 2006.10.30 දින සිට නැවත නියමයක් කරන තුරු ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඩී. ඒ. එල්. ඉලේපෙරුම මහත්මිය 2006.11.01 දින සිට නැවත නියමයක් කරන තුරු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 මාර්තු මස වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,කොළඹ 07.
04-309

ආණ්ඩුවේ නිවේදන

මගේ යොමු අංකය : ඊඩී/1/8/2/කො/44.

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

කොළඹ දිස්ත්‍රික්කයේ, පිළියන්දල, හිරිමංගල වත්ත, උතුරුමාවියේ ශාන්ති විහාරස්ථානයේ පිහිටි කො/විද්‍යාශාන්ති මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය වැල්ලවත්තේ පඤ්ඤාසිරි ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.
04-348/1

D/RF/555/RECT/NY.

ශ්‍රී ලංකා නාවික හමුදාව

නිරීක්ෂණ මුර නෞකාව අධිකාරියට පත් කිරීම

ශ්‍රී ලංකා නාවික හමුදාවට මෑතකදී පවරාගත් නිරීක්ෂණ මුර නෞකාව 2006 ජුනි මස 09 වැනි දින සිට පී 622 – ශ්‍රී ලංකා නාවික නෞකා සාගර වශයෙන් අධිකාරියට පත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජුනි මස 08 වැනි දින,
කොළඹ.
04-359

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/කැ/38.

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

කැගල්ල දිස්ත්‍රික්කයේ, පූනහැල, බුලත්කොහුපිටියේ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ පිහිටි කැ/ශ්‍රී දේවරක්ෂිත මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය බැද්දේවෙල සුමනසිරි ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර,
අධ්‍යාපන අමාත්‍යාංශයේ, "ඉසුරුපායේ",
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.
04-348/4

මගේ යොමු අංකය : ඊඩී/1/8/2/ගම්/මිනු/22

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, රද්දොළුව කොටුගොඩ, සුබෝධාරාම විහාරස්ථානයේ පිහිටි ගම්/මිනු/ශ්‍රී ධර්මානන්ද මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කිරීමෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය රද්දොළුවේ විමලවංශ ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.
04-348/2

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/කැ/37

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

කැගල්ල දිස්ත්‍රික්කයේ, මොළගොඩ කුඹල්දිවෙල, ගලහණේ පුරාණ විහාරස්ථානයේ පිහිටි කැ/ශ්‍රී සද්ධර්මෝදය මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරනමෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය හෙට්ටිමුල්ලේ සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.
04-348/3

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/මා/18

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

මාතලේ දිස්ත්‍රික්කයේ, හඳුන්ගමුව ග්‍රාමයෙහි, ශ්‍රී අභිනවාරාම විහාරස්ථානයේ පිහිටි මා/ශ්‍රී ඤාණිස්සර මූලික පිරිවෙන 2005.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය හඟුරන්කෙත පේමරතන ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.
04-348/5

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/අම්/19.

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ), (ආ) (ඇ), (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය, නවමැදගම ශ්‍රී සද්ධර්මාරාම විහාරස්ථානයේ පිහිටි අම්/ශ්‍රී සද්ධර්මාරාම මූලික පිරිවෙන 2006.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය හුරිකඩුවේ පවරකිත්ති ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින්, එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2007 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ",
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.
04-348/6

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0100005455.

ණයකරුගේ සම්පූර්ණ නම : වැමුල්ලගේ ගාමිණී උදය රංජිත්.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. ජයරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1330 හා 2000.12.04 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත)) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස්දහස් හයසිය හැත්තෑඅටයි ශත හැටහයක (රු. 1,30,678.66) ක මුදලක් වර්ෂ 2006.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ පහලොස් දහස් හයසිය තිස්හතයි ශත හතලිස්නමයක (රු. 1,15,637.49) මුදල ද, වර්ෂ 2006.01.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් පහලොස් දහස් හතලිස් එකයි ශත දාහතක් (රු. 15,041.17) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස්දහස් හයසිය හැත්තෑඅටයි ශත හැටහයක (රු. 1,30,678.66) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ පහලොස් දහස් හයසිය තිස්හතයි ශත හතලිස්නමයක (රු. 1,15,637.49) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොලියක් 2006.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. චිත්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ මාර්තු මස 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ, තලගල ග්‍රාමයෙහි පිහිටි කුඹුකේ එස්ටේට් නමැති ඉඩමට 1999.12.31 දින කේ. ඩී. ජී. වීරසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 1729 පිඹුර ප්‍රකාර ලොට් 102ට මායිම්, උතුරට : ලොට් 113 ද, නැගෙනහිරට : ලොට 115 ද, දකුණට : ලොට් 100 ද, බස්නාහිරට : ලොට් 101 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාසයයි දශම හතයි හයක (අ. 0, රූ. 0, පර්. 16.76) හෝ හෙක්ටයාර් බිඳුවයි දශම බිඳුවයි හතරක දෙකයි හතරක (හෙක්. 0.0424) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතාවය ද සමඟ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 185/248 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

04-395

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 04/0/00/01077 සහ 04/70/00/0719.

ණයකරුගේ සම්පූර්ණ නම : සුසන්ත කීර්ති කුමාර වීරසූරිය.

මහනුවර සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. අබේසිංහ සහ එම්. ඩබ්. සෙනෙවිරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1254 සහ 8919 හා 1998.11.05 සහ 1997.11.22 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන)) පනතින් (සංශෝධිත)) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසි දෙදහස් හත්සිය හතරයි ශත දහහතරක (රු. 3,22.,704.14) ක මුදලක් වර්ෂ 2003.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් හයසිය හතලිස්එකයි ශත හැත්තෑහතක (රු. 2,52,641.77) මුදල ද, වර්ෂ 2003.09.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හැත්තෑ දහස් හැටදෙකයි ශත තිස්හත (රු. 70,062.37) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ විසි දෙදහස් හත්සිය හතරයි ශත දහහතරක (රු. 3,22.704.14) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ පනස්දෙදහස් හයසිය හතලිස්එකයි ශත හැත්තෑහතක (රු. 2,52,641.77) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% සහ 17.00% බැගින් වන පොලියක් 2003.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2003ක් වූ නොවැම්බර් මස 25 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පල්ලෙගම්පහ පත්තුවේ පාතදුම්බර කෝරළේ, පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාවේ නාරන්දන්ඩ ග්‍රාමයෙහි පිහිටි රාමචන්ද්‍ර වතුයාය, ගුරුකැටේහේන සහ හේනෙගෙදර වලව්ව වත්ත නමැති ඉඩමට 1996.01.05 දින එස්. විජේරත්න මානකතැන විසින් මැන සම්පාදිත අංක 3891 පිඹුර ප්‍රකාර ලොට් 215 ට මායිම්, උතුරට : ලොට් 217 සහ 216 ද, නැගෙනහිරට : ලොට් 216 සහ 214 ද, දකුණට : ලොට් 213, 214 සහ 338 (මාර්ග රක්ෂිතය) ද, බටහිරට : ලොට් 217 සහ 338 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම දෙකක් (අ. 0 රූ. 0 පර්. 13.2) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 649/85 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී නාරන්දන්ඩ ග්‍රාමයෙහි පිහිටි රාමචන්ද්‍ර වතුයාය, ගුරුකැටේහේන සහ හේනෙගෙදර වලව්ව වත්ත නමැති ඉඩමට 1996.01.05 දින එස්. විජේරත්න මානකතැන විසින් මැන සම්පාදිත අංක 3891 පිඹුර ප්‍රකාර ලොට් 216 ට මායිම්, උතුරට : ලොට් 217 සහ 338 (මාර්ග රක්ෂිතය) ද, නැගෙනහිරට : ලොට් 214 සහ 338 (මාර්ග රක්ෂිතය) ද, දකුණට : ලොට් 214 සහ 215 ද, බටහිරට : ලොට් 217 සහ 215 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහක (අ. 0 රූ. 0 පර්. 12.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 649/86 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරී.

04-397

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් විසින් අනුමත කරන ලද යෝජනා සම්මුතියේ දැන්වීමයි

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව සම්මත කරන ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

"මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඕ. ආර්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද වර්ෂ 2006ක් වූ ජනවාරි මස 23 වන දිනැති අංක 8972 දරන උකස් බැඳුම්කරය මගින්, මාතලේ, මහදේවල පාර, අංක 03 දරන ස්ථානයේ මයලාගු ෂෂිකරන් යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76 හි පිහිටි (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත උකස් කරන ලද හෙයින් ද,

තව ද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීමට මයලාගු ෂෂිකරන් යන අය විසින් පැහැර හරින ලදුව වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 වන දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත එකී බැඳුම්කරය මත රුපියල් එක් මිලියන එක් ලක්ෂ තිස් හත් දහස් එකසිය තිහකුත් ශත හතලිස් දෙකක (රු.11,37,130.42) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, එකී රුපියල් එක් මිලියන එක් ලක්ෂ තිස් හත් දහස් එකසිය තිහකුත් සත හතලිස් දෙකක (රු.11,37,130.42) මුදල ද, වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 29 වන දින සිට විකිණීමේ දිනය දක්වා අයිරා ණය පහසුකම මත වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 වන දින වන විට හිඟව ඇති ප්‍රාග්ධන මුදල වන රුපියල් නවලක්ෂ තිස් දහස් හයසියයක (රු. 9,30,00) මුදලක් මත එක් වර්ෂයකට 20.53% ක අනුප්‍රමාණය බැගින් තවදුරටත් පොලිය ද වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 දින වන විට අයිරා පහසුකම මත හිඟව පවතින රුපියල් එක් ලක්ෂ හතලිස් පන් දහස් හාරසිය තිස් නවයකුත් ශත විසි තුනක (රු.1,45,439.23) මුදලක් මත එක් වර්ෂයකට 33% බැගින් ගණන් බලනු ලැබූ අනුප්‍රමාණයට මාසිකව වැල් පොලිය ද, සමග එයට අදාළ ව්‍යවස්ථාපිත ගාස්තු ද, ප්‍රචාරය කිරීමේ ගාස්තු ද, වැය කරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) මුදල අඩුකර පසු මුදල, අයකර ගැනීම සඳහා වත්තල, හැඳල, පල්ලිය වත්තේ, ප්‍රීතිපුර පාරේ අංක 247 හි බලයලත් වෙන්දේසිකරු ගාමිණී බී. එස්.දියාව විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ."

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට, ගංදහය කෝරළේ දකුණේ, බුටාවත්තේ පිහිටි, මහනුවර බලයලත් මිනින්දෝරු පී. ස්පෙන්සර් විසින් සාදන ලද වර්ෂ 1946ක්වූ ඔක්තෝබර් මස 2 වන දිනැති අංක 377/100 දරන පිඹුරේ ලොට් 3,4,5 සහ 6 වශයෙන් සලකුණු කොට දැක්වෙන නිකතැන්නවත්තේ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: හාතමුණේ වත්ත සහ රෙන්ගසාමිගේ වත්ත ද, නැගෙනහිරට : රෙංගසාමිපිල්ලෙයි ගේ වත්ත සහ වයියපුරි ඩිල්ලාට අයිති නිකතැන්න එගොඩ ඇල හේන ද දකුණට : ගල සහ එඩරු වැට සහ එල්. කිරි බණ්ඩාට අයිති ඉඩම ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 2 ද වන ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දහතුනක් (අක්කර 2 රූඩ් 3 පර්චස් 13) හෝ බලයලත් මිනින්දෝරු එස්. කැකුලන්දර විසින් සාදන ලද වර්ෂ 1986 ක්වූ අගෝස්තු මස 20 වන දිනැති අංක 329 දරන මැනුම් පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිහක් (අක්කර 2 රූඩ් 3 පර්චස් 30) වන ඉඩම් කොටස. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම /පත්ඉරු ජී. 424/92හි ලියාපදිංචි වී ඇත.

නැවත මැනීමක් කරනු ලැබ, බලයලත් මිනින්දෝරු එස්. කැකුලන්දර මහතා විසින් සාදන ලද අංක 329 සහ වර්ෂ 1986ක් වූ අගෝස්තු මස 28 වන දින දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ල ලෙස නිරූපිත එකී ඉඩම සහ පරිශ්‍රය, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට, ගන්දහය කෝරළේ නිකතැන්නෙහි පිහිටා ඇති බලයලත් මිනින්දෝරු පී. ස්පෙන්සර් විසින් සාදන ලද අංක 377/100 සහ වර්ෂ 1946ක් වූ පෙබරවාරි මස 4 වන සහ ඔක්තෝබර් මස 2 වන දින දරන පිඹුරේ කැබලි අංක 3,4,5 සහ 6 දරන නිකතැන්නවත්තේ බෙදා වෙන් කරන ලද කොටසක් වශයෙන් විස්තර කර ඇති අතර, එකී අංක 329 හා වර්ෂ 1986ක් වූ අගෝස්තු මස 28 වන දින දරන පිඹුරේ සඳහන් එකී අංක 1 බිම් කැබැල්ල, ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිහකින් (අක්කර 2 රූඩ් 3 පර්චස් 30) සමන්විත වේ. උතුරට : හාතමුණේ වත්ත ද, නැගෙනහිරට : ඒ. විමලසූරිය හිමිකම් පාන ඉඩම, කරුපයියා සහ ජෝන් ගේ ඉඩම සහ ඩී. කේ. ජී. රන් බණ්ඩා ගේ ඉඩම ද, දකුණට : එල්. කිරිබණ්ඩා විසින් හිමිකම් පාන ඉඩම ද, බස්නාහිරට : අංක 377/100 දරන පිඹුරේ ලොට් 2 දරන ඉඩමේ ඉතිරි කොටස ද සහ එහි පිහිටි සියලුම දේ සමග වේ.

නැවත මැනීමක් කරනු ලැබ, බලයලත් මිනින්දෝරු එන්. ඩී. බී. වැත්තෑව විසින් සාදන ලද අංක 3437 සහ වර්ෂ 2005ක් වූ මාර්තු මස 17 වන දින දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ල ලෙස නිරූපිත එකී ඉඩම සහ පරිශ්‍රය, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට, ගන්දහය කෝරළය දකුණ, නිකතැන්නේ පිහිටා ඇති (බලයලත් මිනින්දෝරු එස්. කැකුලන්දර විසින් සාදන ලද අංක 329 හා වර්ෂ 1986ක් වූ අගෝස්තු මස 28 වන දින දරන පිඹුරේ අංක 1 බිම් කැබැල්ල වන) නිකතැන්න වත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම වශයෙන් විස්තර කොට ඇති අතර, අංක 3437 දරන එකී පිඹුරේ අංක 1 බිම් කැබැල්ල වන එකී ඉඩම ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිහකින්(අක්කර 2 රූඩ් 3 පර්චස් 30) සමන්විත වේ.

උතුරට : හාතමුණේ වත්ත සහ රෙන්ගසාමිගේ වත්ත ද, නැගෙනහිරට : ඒ. විමලසූරිය හිමිකම්පාන ඉඩම, කරුපයියා සහ වෙනත් අයගේ ඉඩම සහ ඩී. කේ. ජී. රන් බණ්ඩා සහ අනෙක් අයගේ ඉඩම ද, දකුණට : ප්‍රධාන පාරේ සිට ප්‍රවේශ මාර්ගය සහ කලින් කිරි බණ්ඩාගේ ඉඩම ද, බස්නාහිරට : ආරුමුගම් සහ වෙනත් අයට අයිති නිකකැන්න වත්ත සහ රාජරත්නම්ගේ නිකකැන්නේ වත්ත ද, සහ එහි පිහිටි සියලුම දේද සමග වේ

මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 76, යෝර්ක් වීදිය,
කොළඹ 01.
04-342/1

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් විසින් අනුමත කරන ලද යෝජනා සම්මතියේ දැන්වීමය

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව සම්මත කරන ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ :

"මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඕ. ආර්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද වර්ෂ 2002ක් වූ නොවැම්බර් මස 09 වන දිනැති අංක 8293 දරන උකස් බැඳුම්කරය මගින්, දෙදෙනාම, මහනුවර, පේරාදෙණිය පාර, අංක 524/1 හි පදිංචි "ක්‍රිස්ටල් ලංකා එන්ටර්ප්‍රයිසස් " යන නාමය, අභිධානය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාරයක් කරගෙන යන දැනට මහනුවර තැන්නේකුඹුර, හේවාහැට පාරේ අංක 89 දරන ස්ථානයේ මඳුවතී සමරසේකර විවාහයට පෙර ජයවික්‍රම සහ දූනුවිලගේ අනුර ජයවික්‍රම යන අයවලුන් විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76 හි පිහිටි (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කෙරෙන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත උකස් කරන ලද හෙයින් ද,

තව ද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල ගෙවීමට එකී මඳුවතී සමරසේකර විවාහයට පෙර ජයවික්‍රම සහ දූනුවිලගේ අනුර ජයවික්‍රම යන අයවලුන් විසින් පැහැර හරින ලදුව වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 වන දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත එකී බැඳුම්කරය මත රුපියල් මිලියන දෙකකුත් පන් ලක්ෂ අසූඅටදහස් තුන්සිය තිස් හතරක් සහ සත පනස් නවයක (රු.25,88,334.59) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, එකී රුපියල් මිලියන දෙකකුත් පන්ලක්ෂ අසූ අටදහස් තුන්සිය තිස් හතරක් සහ ශත පනස් නවයක (රු.25,88,334.59) මුදලද, වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 29 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලීන ණය මත වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 වන දින වන විට කාලීන ණය මත හිඟව ඇති ප්‍රාග්ධන මුදල වන රුපියල් මිලියන දෙකයි එක් ලක්ෂ විසි අට දහස් හාරසිය සත හැත්තෑ දෙක (රු.21,28,414.72) මුදලක් මත එක් වර්ෂයකට 18.5%ක අනුප්‍රමාණය බැගින් තවදුරටත් පොලිය ද වර්ෂ 2006ක් වූ නොවැම්බර් මස 28 වන දින වන විට, අයිරා පහසුකම මත හිඟව පවතින රුපියල් තුන් ලක්ෂ හැත්තෑ හත් දහස් අටසිය හතකුත් ශත අසූ තුනක (රු.377,807.83) මුදලක් මත එක් වර්ෂයකට 30% බැගින් ගණන් බලනු ලැබූ අනුප්‍රමාණයට මාසිකව වැල් පොලිය ද, සමග එයට අදාළ ව්‍යවස්ථාපිත ගාස්තු ද, ප්‍රචාරය කිරීමේ ගාස්තු ද, වැය කරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) මුදල අඩු කළ පසු මුදල, අයකර ගැනීම සඳහා වත්තල, හැඳල, පල්ලිය වත්තේ අංක 247 හි බලයලත් වෙන්දේසිකරු ගාමිණී බී. එස්. දියාව විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණුනු ලැබීමට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ."

උපලේඛනය

ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාතේ,මහනුවර දිස්ත්‍රික්කයේ, නගර සභා සීමාව ඇතුළත, පේරාදෙණිය පාරේ පිහිටි අංක 524 සහ 526 (පැරණි අංක 784, 786 සහ 785ඒ) දරන පරිශ්‍රවල කොටසක් වන බලයලත් මිනින්දෝරු එල්. බී. බැද්දේවෙල විසින් සාදන ලද වර්ෂ 1958ක් වූ මැයි මස 27 සහ 28 වන දිනැති අංක 406 පිඹුරේ ලොට් 1 වශයෙන් සලකුණු කොට දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී ලොට් 1 දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරු-නැගෙනහිරට : කලින් අංක 786 සහ 787 දැන් අංක 522 දරන පරිශ්‍ර ද, දකුණු - නැගෙනහිරට : ලොට් 2 සහ ලොට් 2 දරන පොදු පැසේජය ද දකුණු-බටහිරට : පැරණි අංක 783 සහ දැන් අංක 528 දරන පරිශ්‍ර ද උතුරු-බටහිරට : මැසොනික් ලොජ් ද වන ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 11.9) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමග. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු ඒ 312/218 හි ලියාපදිංචි වී ඇති අතර,

ඉහත කී නව අංක 524 සහ 526 (පැරණි අංක 784 සහ 786ඒ) දරන පරිශ්‍රවල කොටසක් වන ඉහත කී පේරාදෙණියේ පිහිටි ලොට් 4 දරන පොදු පැසේජයේ මාර්ග අයිතිවාසිකම ද සමග වේ. එකී ලොට් 4ට මායිම් ඊසාතට : මෙම ඉඩමේ ම ලොට් 2 සහ 3 කොටස් ද, ගිණිකොනට : පේරාදෙණිය පාර ද, නිරිතට : අංක 783 දරන පරිශ්‍රය නව අංක 528 ද සහ ද වයඹට : ලොට් 1 ද වන ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 6.50) විශාල ඉඩම සහ එහි පිහිටි සියලුම දේ සමග වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු ඒ319/58 හි ලියාපදිංචි වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 76, යෝර්ක් වීදිය,
කොළඹ 01.
04-342/2

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් විසින් අනුමත කරන ලද යෝජනා සම්මුතියේ දැන්වීම

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ සැප්තැම්බර් මස 09 වන දින ඒකමතිකව සම්මත කරන ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ :

"කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ඉහලගම විසින් සහතික කරන ලද වර්ෂ 2004ක් වූ ජූලි මස 6 වන දිනැති අංක 10892 දරන උකස් බැඳුම්කරය මගින්, බෝයගනේ, මල්පිටිය, අරලිය උද්‍යානයේ අංක 16 හි "මල්සර ලංකා කට්පීස් සෙන්ටර් " හි අයිතිකරු වන වීදාගම ආරච්චිගේ වසන්ත යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ

